# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: NPD/GOV/DDP//1-1
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.08. 13

මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ: MF/NPD/1/2025

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

## දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන - 2025

දීර්ඝ කාලයක් තිස්සේ දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය වශයෙන් ඇති සංවර්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණ ඇතිව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළද තවදුරටත් අවධානය යොමුකළ යුතු සංවර්ධන අවශ්‍යතාවයන් හඳුනාගෙන ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහනක් ලෙස දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2025 අයවැයෙන් රුපියල් මිලියන 2,000 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. මෙමඟින්, මෙතෙක් අවධානයට ලක් නොවූ සහ නැගී එන සංවර්ධන හා ආර්ථික අවශ්‍යතා සපුරාලීම, ප්‍රාදේශීය ප්‍රජාවන්ට ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා බලගැන්වීම සහ නිෂ්පාදන පාදක ආර්ථික වර්ධනය සඳහා අඩිතාලම දැමීම මඟින් සියලුම දිස්ත්‍රික්ක පුරා තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණයි. ඒ අනුව, මෙම වැඩසටහන ද රටේ දිළිඳුබව තුරන් කිරීමේ රජයේ ජාතික ඉලක්කය සාක්ෂාත්කර ගැනීම සඳහා දායක වේ.

## 1. වැඩසටහනේ අරමුණු

2025 වර්ෂය තුළදී මෙම ප්‍රතිපාදනය ඵලදායීව උපයෝජනය කරමින් ප්‍රජාවට ප්‍රතිලාභ ලබාදීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ. එහිදී එහිදී පහත අරමුණු සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වේ.

- යටිතල පහසුකම් ඉහළ නැංවීම
- දේශීය නිෂ්පාදන හැකියාවන් ප්‍රවර්ධනය
- සේවා සැපයුම් යාන්ත්‍රණ කාර්යක්ෂම කිරීම
- වෙළඳ සහ අලෙවිකරණ පහසුකම් වැඩි දියුණු කිරීම
- ආයතනික ධාරිතා ශක්තිමත් කිරීම

## 2. ව්‍යාපෘති තෝරා ගැනීමේ නිර්ණායක

2.1 එක් ව්‍යාපෘතියක වටිනාකම

- අවම ව්‍යාපෘති පිරිවැය : රු. 250,000.00
- උපරිම ව්‍යාපෘති පිරිවැය : රු. 2,000,000.00

2.2 දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීමේ දී පහත සංවර්ධන ක්ෂේත්‍ර වෙත ප්‍රමුඛතාව යොමු කළ යුතුය.

i. නිෂ්පාදන ආර්ථිකයක් උදෙසා අවශ්‍යවන ග්‍රාමීය/කෘෂි මාර්ග සහ අනෙකුත් පොදු යටිතල පහසුකම් සංවර්ධනය
ii. දේශීය නිෂ්පාදන හැකියාවන් ප්‍රවර්ධනය
iii. ග්‍රාමීය සහ ප්‍රාදේශීය මට්ටමින් සංචාරක යටිතල පහසුකම් ප්‍රවර්ධන ව්‍යාපෘති
iv. සුළු වාරිමාර්ග පද්ධති නවීකරණය කිරීම / ඇළ වේලි,පොදු කමත් සංවර්ධනය
v. අලෙවිකරණ සහ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන/ සති පොළ සංවර්ධනය හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම්
vi. ඉහත සඳහන් ප්‍රමුඛතා අංශයන්ට අදාළ දැනටමත් ආරම්භ කර ඇති, එහෙත් නිම නොවූ (අඩක් නිමි) ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම නිම කළ හැකි නම් එම ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.
vii. දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය වශයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු සංවර්ධන අවශ්‍යතා

2.3 ක්‍රියාත්මක කිරීමේ සූදානම: ව්‍යාපෘති පහත අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය,

- ඉඩම් නිරවුල් වීම.
- ප්‍රධාන පාර්ශවකරුවන් හඳුනාගෙන, ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- පූර්ව සූදානමක් පැවතීම (දැනටමත් ඇස්තමේන්තු සකස් කර ඇති ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදීම).
- ශක්‍යතාවයෙන් ඉහළ වීම.
- බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගත යුතු අනුමැතීන් අවම වීම (කාලය සීමිත බැවින්).
- ප්‍රසම්පාදන කටයුතු කෙටි කාලයකින් අවසන් කළ හැකි වීම සහ නියමිත කාලය තුළදී ක්‍රියාත්මක කර අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් තෝරා ගැනීම.

2.4 ඉහත සඳහන් ප්‍රමුඛතාවන් යටතේ ව්‍යාපෘති හඳුනාගැනීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පොදු හා සාමූහික අවශ්‍යතා සඳහා පමණක් ප්‍රමුඛතාවය ලබාදිය යුතු අතර තනි පුද්ගල ක්‍රියාකාරකම් වලින් බැහැර විය යුතු බවට අවධාරණය කෙරේ.

## 3. ව්‍යාපෘති හඳුනාගැනීම, අනුමත කිරීම සහ ප්‍රතිපාදන නිදහස් කිරීම

3.1 මෙම වර්ෂය තුළ මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති අවසන් කර බිල්පත් පියවීම ද සිදු කළ යුතු බැවින්, 2025.08.22 දිනට පෙර ව්‍යාපෘති හඳුනාගැනීම සහ අනුමත කිරීමේ කාර්යය අවසන් කළ යුතුය.

3.2 දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ ඔබගේ දිස්ත්‍රික්කයට වෙන් කෙරෙන මූල්‍ය ප්‍රතිපාදනය ඇමුණුම 1 හි දැක්වේ. එම ප්‍රතිපාදන මෙම චක්‍රලේඛය නිකුත්කිරීමත් සමඟම ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත නිදහස් කරනු ඇත.

3.3 ඉහත අංක 2 නිර්ණායක හා අනුකූල වන පරිදි හා ඔබගේ දිස්ත්‍රික්කයේ පවතින ස්වභාවික සම්පත්, අමුද්‍රව්‍ය, ආර්ථික කටයුතු සඳහා යොදා ගත හැකි භූමි ප්‍රමාණය, පාරිසරික තත්ත්ව, ජනතාවගේ ආර්ථික කටයුතු, ප්‍රදේශයට සුවිශේෂී වූ සංවර්ධන අවශ්‍යතා මෙන්ම දරිද්‍රතාවයෙන්

පෙළෙන ජනකණ්ඩායම් පිළිබඳ සැළකිල්ලට ගනිමින්, කඩිනමින් ජනතාවට ප්‍රතිලාභ හිමිවන සංවර්ධන අවශ්‍යතා දිස්ත්‍රික්ක හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගත යුතුය.

3.4 ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම් සඳහා අරමුදල් වෙන් කිරීමට ප්‍රථමව එම ඉදිකිරීම යෝජිත අරමුණු සඳහා අනාගතයේ දී බාධාවකින් තොරව යොදා ගත හැකි බව හා නඩත්තු කටයුතු සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බවට දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් විසින් සෑහීමකට පත්විය යුතුය.

3.5 මෙම වැඩපිළිවෙළට සමගාමීව යටිතල පහසුකම් සංවර්ධනය, නිෂ්පාදන ආර්ථිකය සහ අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් අයවැය හරහා රේඛීය අමාත්‍යාංශ විසින් සිදුකරන වැඩසටහන් සහ ව්‍යාපෘති සමඟ ද්විකරණයක් සිදු නොවිය යුතුය.

3.6 මෙම කාර්යය සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ යටතේ ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. එසේම මෙම කාර්යය සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සේවයේ නියුතු නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන් (ක්‍රමසම්පාදන) අනුයුක්ත කිරීමට පියවර ගත යුතුය.

3.7 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ උපදෙස් පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංවර්ධන ව්‍යාපෘති සකස් කර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය සහිතව දිස්ත්‍රික් ලේකම්වරයා වෙත යොමු කළ යුතුය.

3.8 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් යොමුකරන සංවර්ධන යෝජනා අතරින් දිස්ත්‍රික්කයට වෙන් කෙරෙන ප්‍රතිපාදන යොදාගනිමින් 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ හැකි ඉහළ ප්‍රමුඛතාවයකින් යුතු ව්‍යාපෘති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මඟින් තීරනය කර අනුමත කළ යුතුය.

3.9 අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සමඟ අදාළ ප්‍රාදේශීය ලේකම් වරු වෙත කඩිණමින් යොමු කළ යුතුය.

3.10 අනුමත කරනු ලැබූ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු 2025 අගෝස්තු 28 වන දිනට පෙර, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත, ව්‍යාපෘති කළමණාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව යොමු කළ යුතුය

## 4. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

4.1 සියලුම ව්‍යාපෘති රජයේ අනුමත නීතිරීති, චක්‍රලේඛ, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක වන බවට වගබලා ගත යුතුය.

4.2 සංවර්ධන ව්‍යාපෘති, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ ප්‍රජා පාදක සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත් පැවරීමේ දී, එම ප්‍රජා පාදක සංවිධාන වෙත මෙම කාර්යය සිදු කිරීමට ඇති හැකියාව සහ එම සංවිධාන මඟින්ම අදාළ සංවර්ධන කාර්යය ඉටුකරන බවට සහතික විය යුතුය.

4.3 දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන 2025 යටතේ අනුමත වූ ව්‍යාපෘති යෝජනා, 2025 දෙසැම්බර් මස 15 වන දිනට පෙර අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

## 5. වැඩසටහන අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදය

5.1 "දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන" ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්ක මට්ටමේ ප්‍රගතිය සතිපතා සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ යටතේ නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

5.2 මෙම සමස්ත වැඩසටහන ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය කරනු ලබන අතර, ඒ සම්බන්ධ උපදෙස් හා මාර්ගෝපදේශ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී නිකුත් කරනු ඇත.

## 6. වෙනත් කරුණු

6.1 ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා එක් එක් ව්‍යාපෘතියේ වටිනාකමින් 3% කට නොවැඩි ප්‍රතිපාදනයක් සහ ඉදිකිරීමක් නොවන ව්‍යාපෘති සඳහා 1% කට නොවැඩි ප්‍රතිපාදනයක් පරිපාලන වියදම් ලෙස වෙන් කළ හැකි අතර එය පහත පරිදි උපයෝජනය කළ යුතුය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආශ්‍රිත කටයුතු සඳහා 25% උපරිමයකට යටත්ව
(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ක්‍රියාත්මක කරන ආයතන ආශ්‍රිත කටයුතු සඳහා 75% උපරිමයකට යටත්ව

6.2 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන සහ දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතනවලට අනුයුක්ත තාක්ෂණික නිලධාරීන් සහ තාක්ෂණික සහායක නිලධාරීන්ගේ සේවය උපරිම අයුරින් දායක කර ගත යුතුය.

6.3 මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් හඳුනාගත යුතුය. 2025 වර්ෂයෙන් ඉදිරියට ව්‍යාපෘති අවිච්ඡේද කිරීම කිසිඳු අයුරකින් නොකළ යුතුය.

6.4 දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන 2025 මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට සිදුවන සියලුම ආකාරයේ බදු හා වෙනත් ගෙවීම් මෙම වැඩසටහන යටතේ ලබාදෙන ප්‍රතිපාදන මඟින්ම ආවරණය කර ගත යුතු අතර ඒ සඳහා අමතර ප්‍රතිපාදන හිමි නොවේ.

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
ලේකම්

පිටපත් -

1. ගරු පළාත් ආණ්ඩුකාරවරු - කාරුණික දැන ගැනීම පිණිස

2. සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු - කාරුණික දැන ගැනීම පිණිස
3. ජනාධිපති ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
4. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම පිණිස
6. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කාරුණික දැනගැනීම පිණිස
7. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම පිණිස
8. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
9. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
10. අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
11. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව- කාරුණික දැනගැනීම හා අ.ක.ස
12. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරුන් - කාරුණික දැනගැනීම හා අ.ක.ස
13. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කාරුණික දැනගැනීම හා අ.ක.ස

# දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන - 2025

මුළු ප්‍රතිපාදන: රු. මිලියන 2,000 කි

එක් එක් දිස්ත්‍රික්කය සඳහා අරමුදල් වෙන් කිරීම බහුමාන දරිද්‍රතා දර්ශකය (Multidimensionality Poverty Index - MPI) මත පදනම්ව සිදු කෙරේ.

| | දිස්ත්‍රිකය | බහුමාන දරිද්‍රතා දර්ශකය (MPI) | ප්‍රතිපාදන (රු. මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 01 | නුවරඑළිය | 0.193 | 197 | 9.85 |
| 02 | බදුල්ල | 0.153 | 157 | 7.85 |
| 03 | මොණරාගල | 0.141 | 144 | 7.20 |
| 04 | රත්නපුර | 0.116 | 119 | 5.95 |
| 05 | මන්නාරම | 0.112 | 115 | 5.75 |
| 06 | වව්නියාව | 0.110 | 113 | 5.65 |
| 07 | මහනුවර | 0.096 | 98 | 4.90 |
| 08 | මඩකළපුව | 0.085 | 87 | 4.35 |
| 09 | පොළොන්නරුව | 0.085 | 87 | 4.35 |
| 10 | මාතලේ | 0.081 | 83 | 4.15 |
| 11 | හම්බන්තොට | 0.081 | 83 | 4.15 |
| 12 | කෑගල්ල | 0.075 | 77 | 3.85 |
| 13 | මාතර | 0.074 | 76 | 3.80 |
| 14 | අනුරාධපුරය | 0.071 | 73 | 3.65 |
| 15 | කිළිනොච්චිය | 0.060 | 61 | 3.05 |
| 16 | ත්‍රිකුණාමලය | 0.059 | 60 | 3.00 |
| 17 | අම්පාර | 0.058 | 59 | 2.95 |
| 18 | මුලතිව් | 0.054 | 55 | 2.75 |
| 19 | කුරුණෑගල | 0.048 | 49 | 2.45 |
| 20 | කළුතර | 0.046 | 47 | 2.35 |
| 21 | පුත්තලම | 0.044 | 45 | 2.25 |
| 22 | ගාල්ල | 0.041 | 42 | 2.10 |
| 23 | යාපනය | 0.039 | 40 | 2.00 |
| 24 | ගම්පහ | 0.019 | 19 | 0.95 |
| 25 | කොළඹ | 0.014 | 14 | 0.70 |
| | | | 2,000 | 100 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව